# POLICE WEEKLY CIRCULAR

Supplement to the Ceylon Government Gazette No. 4,904.

No. 805.—FRIDAY, JANUARY 11, 1889.

# THE HUE AND CRY.

***NOTICE.—Any person giving information leading to the apprehension of an offender, or to the discovery of stolen property, may be rewarded on the recommendation of the Inspector-General of Police.***

***Any person found in possession of stolen articles advertised in the "Hue and Cry" is liable to prosecution.***

## OFFENDERS.

### WANTED BY THE POLICE.

NAME, Gregoris Perera; charged with forgery at Pettah, Colombo, on December 23, 1888; is a Sinhalese; religion, Roman Catholic; said to be a carpenter on the Railway; age, about 27 years; height, about 5 ft. 4 in.; complexion, dark brown; nose, prominent; mouth, small; teeth, well set; eyes, small, black; hair, black, cut short, parted in the middle; thick moustaches, slight whiskers and beard; general residence, said to be Maradana.

Name, M. Muttaya; charged with having knowingly framed a false check roll at Taldena in Badulla; is a Tamil of the Wellala caste; religion, Hindu; occupation, overseer; age, 22 years; height, 5 ft. 3 in.; make, thin; complexion, brown; teeth, well set; eyes, dark, sharp; hair, dark, cropped; slight moustaches; is a smart-looking young man; birthplace, Changanai, Jaffna; is known to Mr. C. Sapapathy of Vavuniya-Vilankulam and Mr. Sinnatamby of Mannar; was employed as overseer in the Public Works Department, Taldena-ela, Badulla district; is said to have gone to his country.

## PROPERTY LOST, STOLEN, &c.

### STOLEN.

FROM Barra estate, Rakwana: 1 double-barrelled central-fire 12-bore gun, bearing Negombo Kachcheri No. 3,136, and marked inside the barrel with "No. 12,182," 1 razor, 1 pipe, 1 tobacco pouch, 1 bag with 24 cartridges. A reward of Rs. 10 is offered for the recovery of the property or conviction of the thief or thieves, by the owner, Mr. G. A. Carry.

On the night of December 19, 1888, at Madayawe, Kegalla: a Cochin hen and 4 half-grown chickens. A reward of Rs. 2·50 is offered for the recovery of the fowls or for any information that will lead to their recovery, by the owner, Mr. Charles Brohier.

On the nights of December 24 and 26, 1888, from Villa Rosilla, 81, Kurunegala road; 1 single-barrelled cap gun marked "O. R. 315, O. R. 8852, 1881, 12, 6, J. M. D. R." and bearing Puttalam Kachcheri No. 7,082, dated April 6, 1883, 1 brass chembu marked "R." A reward of Rs. 5 is offered for the recovery of the property, by the owner, Mr. J. M. D. Rosairo.

On the night of December 25, 1888, from Lippakele estate, Dimbula: 1 pair of new Khaki trousers with 6 silver buttons marked "Alfred Webb, Mills, & Co."; 1 pair of thick blue tweed trousers (little old) with small brass buttons marked "Hope Brothers, London"; 1 blue serge coat, 1 pair of tweed trousers, 6 white cloths, 1 white turban, 4 white coats, 1 black coat. A reward of Rs. 10 is offered for the recovery of the property by the owners, Messrs. H. C. Maciver and H. E. W. Cooper.

On the night of January 3, 1889, from Walaha estate, Lindula: 1 brass plate, 1 white coat, 1 small turkey hen six months old, 1 black hen, and 11 eggs. Owners, Mr. G. A. Talbot and his appu, Tasain.

On the night of January 5, 1889, from 244, Dematagoda: 5 brass spittoons, 1 brass hanging lamp. Owner, A. L. M. Abdul Carim.

### STOLEN OR STRAYED.

ON the night of December 17, 1888, at Awisawella: a yellow cow branded "F. M."; also a calf. Owner Dr. C. F. Ephraims.

On the night of January 1, 1889, from 48, St. Sebastian, Colombo: a black bull branded "J" on the right side and another mark on the right leg. Owner, Mr. D. J. Wanigasuriya.

Police Office,
Colombo, January 7, 1889.

L. HOLLAND,
for Inspector-General of Police.

# හොරුන් අල්ලන අණබෙරේ.

දැන්වීමයි.—අපරාධකාරයන් අල්ලාගැණීමට පුළුවන්වෙන්නාවූ හෝ හොරබඩුවක් සොයාගැණීමට පුළුවන්වෙන්නාවූ හෝ දැන්වීමක් කරණ අයෙකුට පොලිසියේ ඉන්ස්පැක්ටර් ජනරාල් තැන කියන හැටියකට තෑගි දෙන්ට යෙදෙනවා ඇත.

මෙහි සඳහන්වෙන යම් හොරබඩුවක් යමෙක්වෙත තිබී සම්භවුනොත් ඔහුට විරුධව පැමිණිලි ගන්ට යෙදෙනවාඇත.

# පොලීසියට ඕනෑකරණ අය.

නම, ග්‍රිගෝරිස් පෙරේරා; වර්‍ෂ 1888 ක්‍රිවු දෙසැම්බර් මස 23 වෙනිදින කොළඹ පිටකොටුවේදී හොර අත්සන්කිරීමේ වරද ගැණ චෝදනාරෝපණයකරතිබේ; සිංහල; රෝමානුකතෝලික ආගම; රේල්වේ වඩුවෙක්ය කියත්; වයස, අවුරුදු 27ක් පමණ ඇත; උස, අඩි 5කුත් අඟල් 4ක් පමණ ඇත; පාට, තලඑළඑයි; නාහේ ඉදිරියට නෙරා තිබේ; කට, පුංචියි; දත්, එකමුතුව තිබේ; ඇස්, පුංචියි කළුයි; ඉසකේ, කළුයි කොටකර කපාලයි; දෙකටබෙදූ පීරාලයි; ඝනවූ උඩුරැවුලක් තිබේ; නිකටේ රැවුල සහ බකබරු යන්තන් තිබේ; බොහෝ සෙයින් පදිංචිස්ථානය, මරදානයයි කියත්.

නම, ඇම්. මුත්තයියා; බදුල්ලට අයිති තෙල්දෙනගමේදී බොරු චැක්රෝල් එකක් සෑදුවායකියා චෝදනාරෝපණය කරතිබේ; දෙමළ; ගොයිගම; හින්දුආගම; ඕවර්සියර්වැඩේ; වයස, අවුරුදු 22යි; උස, අඩි 5යි අඟල් 3යි: ශරීරය, සීන්දුරියි; පාට, තලඑළඑයි; දත්, එකමුතුවතිබේ; ඇස්, කළුයි; ඉසකේ, කළුයි කපාලයි; උඩුරැවුල යන්තම් තිබේ; කඩිසරවූ පෙනීමක්ඇත; උපන්ස්ථානය, යාපනේ චන්ගනිහි; කසාදබැඳලානැත; මොහු අඳුනනඅයවල්, වවුනියාවිලන්කුලම්හි, සී. සපාපති උන්නැහේ සහ මන්නාරමේ සින්නතම්බි උන්නැහේ; බදුල්ලටඅයිති තෙල්දෙන ඇල පුසිබවැඩකම්හාන්ත දෙපාතීමේන්තුවේ ඕවර්සියර්වැඩේ සිටියේය; මොහු, ඔහුගේ ගමට ගියායයි කියත්.

# සොරකම් කළාවූ, නැතිවූනාවූ බඩුආදිය.

## සොරකම්කරන්ට යෙදුනා.

රක්වානේ බාරවත්තෙන්: නොම්මර 3;136 දරණ කදේ "No. 12,182" ලකුණ ඇති කාතු දෙකේ තුවක්කු 1ද, දූලි පිහියා 1ද, පයිප්ප 1ද, දුන්කල දමන සම් පසුම්බි 1ද, කාර්ට්රිජ්ස් 24ක් අඩංගුවූ බෑග් 1ද. මෙම බඩු සොයා ගැණීමට එක්කෝ සොරුන් වරදට පත්කිරීමට සෑහෙන කාරණ කියා දෙන කෙණෙකුට අයිතිකාරයා වන ජී. එච්. කරිඋන්නැහේ විසින් රුපියල් දහයක් තෑගි දෙනුලැබේ.

වර්‍ෂ 1888 ක්‍රිවු දෙසැම්බර් මස 19 වෙනි දින රාත්‍රියේ කෑගල්ලේ මඩයාවෙහිදී: කොච්චි කිකිළියෙක් සහ ලොකු තරමේ කුකුල්පැටව් 4 දෙනෙක්. මෙය සොයාගැණීම පිණිස නොහොත් සොයාගැණීමට සෑහෙන කාරණ කියා දෙන කෙණෙකුට අයිතිකාරයා වන චාර්ලස් බ්‍රෝහියර් උන්නැහේ විසින් රුපියල් දෙකකුත් ශතපණහක් තෑගි දෙනුලැබේ.

වර්‍ෂ 1888 ක්‍රිවු දෙසැම්බර්මස 24 වෙනි සහ 26 වෙනි දිනවල්වල රාත්‍රියේ කුරුණෑගල පාරේ "විලාරෙසිල්ලා" නමැති ගෙදරින්: තුවක්කුවල්ලේ "O.R. 315, C. R. 8852, 1881, 12, 6, J. M. D. R." ලකුණ සහ වර්‍ෂ 1883 ක්‍රිවු අප්‍රේල් මස 6 වෙනිදින පුත්තලමේ කච්චේරියේදී නොම්මර 7,082 ලකුණු කරපු තනිකාතුවේ කැප්තුවක්කු 1ද, "R" ලකුණැති පිත්තල සෙම්බු 1ද, මෙම බඩු සොයාදීමපිණිස අයිතිකාරයා වන ජේ. ඇම්. ඩී. රොසයිරෝ උන්නැහේ විසින් රුපියල් පහක් තෑගි දෙනුලැබේ.

වර්‍ෂ 1848 ක්‍රිවු දෙසැම්බර් මස 25 වෙනි දින රාත්‍රියේ දිඹුලේ ලිප්පකැලේ වත්තෙන්: "Alfred Webb, Mills, & Co." යන ලකුණ ඇති රිදී බොත්තන් හයක් අමුනනලද අළුත් කාකි කලිසන් කුට්ටම් 1ද, "Hope Brothers, London" යන ලකුණු ඇති පුංචි පිත්තල බොත්තන් වගයක් මහපු නිල්පාට ට්වීඩ් කලිසන් කුට්ටම් 1ද, නිල් සර්ජ්කෝට් 1ද, ට්වීඩ් කලිසන් කුට්ටම් 1ද, සුදු රෙදි 6ද, සුදු කලප්පා 1ද, සුදු කෝට් 4ද, කළු කෝට් 1ද. මෙම බඩු සොයා ගැණීමපිණිස අයිතිකාරයෝවන, කේ. සී. මැකිවර් උන්නැහේ සහ එච්. ජී. ඩබ්ල්යු. කූපර් උන්නැහේත් විසින් රුපියල් දහයක් තෑගිදෙනු ලැබේ.

වර්‍ෂ 1889 ක්‍රිවු ජනවාරි මස 3 වෙනි දින රාත්‍රියේ ලිඳුලේ වලහාවත්තෙන්: පිත්තල කැමි 1ද, සුදු කෝට් 1ද, පුංචි කළුකුම් කිකිළියෙක්ද, කළුපාට කිකිළියෙක් සහ කිකිළි බිජු 11ද. අයිතිකාරයෝ, ජී. ඒ. වැල්බොට් උන්නැහේ සහ තාසින්.

වර්‍ෂ 1889 ක්‍රිවු ජනවාරි මස 5 වෙනි දින රාත්‍රියේ දෙමටගොඩ නොම්මර 244රේ ගෙදරින්: පිත්තල පඩික්කන් 5ද, එල්ලන පිත්තල පාන් 1ද. :අයිතිකාරයා, ඒ. ඇල්. ඇම්. අබ්දුල්කාරිම්.

## සොරා ගෙණ යන්ට නොහොත් දඩාවතේ යන්ට යෙදුනා.

වර්‍ෂ 1888 ක්‍රිවු දෙසැම්බර් මස 17 වෙනි දින රාත්‍රියේ අවිස්සාවේල්ලේදී: "F.M." නිවරණ දරණ කහපාට එලදෙනෙක් සහ වස්සෙක්ද. අයිතිකාරයා, සී. ඇප්. ජී. ප්‍රයිම්ස් වෛද්‍යාචාර්‍ය්‍යතැන

වර්‍ෂ 1889 ක්‍රිවු ජනවාරි මස 1 වෙනි දින කොළඹ සන්තබස්තියමේදී: දකුණු තැත්තේ "J." නිවරණද, දකුණු කකුලේ ලකුණක්ද ඇති කළුපාට හරකෙක්. අයිතිකාරයා, සී. ජේ. වනිගසූරිය.